"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary: දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone: 2682868, 2682869, 2682870

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. CSO/FIN/2/3/10(111) | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2016.08.18 |

## මූල්‍ය චක්‍රලේඛ 16/2016

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.).
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

### සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය.

සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 පළාත් සභාවට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.(එම චක්‍රලේඛයේ පිටපතක්ද මේ සමඟ අමුණා එවමි.)

02. ඒ අනුව 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 චක්‍රලේඛය මඟින් සුදුසුකම් ලබන නිලධාරීන් වෙත එහි සඳහන් සුදුසුකම්, යෝග්‍යතාවය, කොන්දේසි හා නියමයන්ට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් කරනු ලැබේ.

03. මෙම චක්‍රලේඛයේ පහත සඳහන් විශේෂ වූ කරුණු වලට අමතරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි සඳහන් සියලු විධිවිධාන ඒ අයුරින්ම බල පැවැත්වේ. ඒවාට අනුකූලව කටයුතු කිරීමට බලපත්‍රලාභියා සහ ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරන ආයතන ප්‍රධානියා තරයේ වගබලා ගත යුතුය. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි සඳහන් විධිවිධානවලට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්පත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුවේ. එහිදී පහත කරුණු විශේෂයෙන් වැදගත් වේ.

04. **බලපත්‍රය ඉල්ලුම්කිරීමේ ආකෘති පත්‍රය.**

බලපත්‍රය ඉල්ලුම්කිරීමේදී මේ සමඟ අමුණා ඇති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි ඇමුණුම් අංක 03 ආකෘතිපත්‍රය භාවිතා කල යුතුවේ. පරිගණක ගත කිරීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කල යුතුයැයි දක්වා ඇති කොටස් අනිවාර්යයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කල යුතු අතර අනෙක් කොටස් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ සිංහල මාධ්‍යයෙන් සම්පූර්ණ කල යුතු වේ.

05. **අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙත.**

අ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලේකම්වරයාගේ නිර්දේශයෙන් පසු ප්‍රධාන ලේකම්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.), " ශ්‍රාවස්ථි මන්දිරය", අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07. යන ලිපියනට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත එවන කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි "සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

ආ) අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේදී වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 චක්‍රලේඛයේ 4.2 හි සඳහන් සියලුම ලිපිලේඛණ ඒ සමඟ ඉදිරිපත් කල යුතුය. එයට අමතරව **ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපතක්ද** ඉදිරිපත් කල යුතුවේ. සියලුම ලියවිලි අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන බවට තහවුරු කර ගැනීම විශේෂයෙන් ලේකම්වරුන්ගේ වගකීම වේ.

ඇ) අයදුම්පත්‍රය, අයදුම්කරු මඟින් හෝ ඔහුට/ඇයට සම්බන්ධ පාර්ශවයක් මඟින් අතින් නොඑවිය යුතුය. අමාත්‍යාංශයේ/කාර්යාලයේ තැපැල අතින් බෙදා හැරීමේ ක්‍රමයක් පවතී නම් එමඟින් එවිය හැකි අතර එසේ එවන්නේ නම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලයේ ඒවා භාරගැනීම සඳහා පත් කර ඇති මාණ්ඩලික නිලධාරී වෙත භාරදිය යුතුය. අතින් එවීමේදී ඒ සම්බන්ධයෙන් කිසියම් හෝ අක්‍රමිකතාවයක් සිදු නොවීමට විධිමත් ක්‍රම පිළිවෙත් අනුගමනය කිරීම ලේකම්වරයාගේ වගකීම වේ.

ඈ) ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාල අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ඒවා ඉදිරිපත් කල යුතු අතර , ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් දෙපාර්තමේන්තු හා වෙනත් කාර්යාලවල අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) මඟින් ඒවා ඉදිරිපත් කල යුතුය. එහිදී අයදුම්පත්‍රයේ ලේකම් යන්නට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ආදේශ විය යුතුය.

ඉ) අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී එහි සඳහන් සියළු කරුණු සම්පූර්ණ කර තිබිය යුතු අතර " අදාල නොවේ හෝ නැත" යනුවෙන් සඳහන් කල යුතු ස්ථාන පවතී නම් එයද සඳහන් කර ඉදිරිපත් කල යුතුය. සෑම කරුණක්ම සම්පූර්ණ කර අයදුම්පත්‍රය ඉදිරිපත් කරන බවට ලේකම්වරු වග බලා ගත යුතුවේ. එවැනි අසම්පූර්ණ අයදුම්පත්‍රයන් ඉදිරිපත් වුවහොත් ඒ විගසම ඒවා ආපසු එවීමට කටයුතු කරනු ලැබේ.

ඊ) වෛද්‍ය කාර්යය මණ්ඩල හා ඒ සම්බන්ධ අනිකුත් කාර්ය මණ්ඩලයන්හි අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විනය කටයුතු නොපවතින බවට නිර්දේශ ලබාගෙන ඉදිරිපත් කිරීමට පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කටයුතු කල යුතුය.ඒ සම්බන්ධ තත්ත්වය අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ආවරණ ලිපියේ සඳහන් කර එවිය යුතුය.

06. **බලපත්‍ර නිකුත් කිරීම.**

අ) පහත පරිදි මුල් බලපත්‍රය සහ පිටපත් 07කින් යුතුව බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

I. මුල් බලපත්‍රය - ලේකම්වරයා වෙත එවනු ලැබේ.

පිටපත්

I. අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
II. අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
III. කොමසාරිස් ජනරාල්
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
IV. විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

} ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් අදාල කාර්යාලය වෙත යවනු ලැබේ.

V. බැංකුවට අදාල පිටපත
VI. ලේකම්වරයාගේ කාර්යාලයට අදාල පිටපත
VII. පෞද්ගලික ලිපි ගොනුවට අදාල පිටපත

} ලේකම්වරයා වෙත එවනු ලැබේ.

ආ) ලේකම්වරයාට එවනු ලබන මුල් පිටපත හා අනිකුත් පිටපත් බලපත්‍රලාභියාට හෝ වෙනත් අයෙකු වෙත කිසිසේත්ම අතින් භාර නොදෙන අතර ඒවා ලේකම්වරයා වෙත එවනු ලැබේ. එසේ එවීමේදී ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කරන අතර, අතින් භාරදෙන්නේ නම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ඒ සඳහා වැඩපිළිවෙලක් යොදනු ඇත.

ඇ) මුල් බලපත්‍රය හා බැංකුවට අදාල පිටපත බලපත්‍රලාභියා වෙත විධිමත් පරිදි ලේකම්වරයා විසින් භාරදිය යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පරිදි විධිමත් වැඩපිළිවෙලවල් යොදා ගත යුතුය.

ඈ) බලපත්‍රලාභියාගේ පෞද්ගලික ලිපිගොනුවට අදාල පිටපත පෞද්ගලික ලිපිගොනුව පවතින කාර්යාලයට යවා එයට ඇතුලත් කරවීම අනිවාර්යයෙන්ම කල යුතු අතර, ඒ සම්බන්ධ පසු විපරම් කර එය ඇතුලත් කළ බවට තහවුරු කර ගැනීම ලේකම්වරයාගේ වගකීම වේ.

07. අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සුදුසුකම් ලබන නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් ඉදිරිපත් කල යුතු අතර, ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ලේකම්වරයා විසින් පෞද්ගලිකව සෑහීමට පත්වී අත්සන් කල යුතුය.

08. මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්,පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා පළාත් භාණ්ඩාගාර ලේකම් ,
බස්නාහිර පළාත.

පිටපත්:01. විගණකාධිපති.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
03. පරිගණක දත්ත ක්‍රියාකරු.

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. TIP/SS/01/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016.07. 14

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2016

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

## සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමට අදාල සියළු යෝජනා ක්‍රම 2015.11.20 දින ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා අනුව අවලංගු කරනු ලැබීය. අනතුරුව මුදල් අමාත්‍යතුමා විසින් ඉහත කරුණ යටතේ ඉදිරිපත් කරන ලද 2016.03.26 දිනැති අංක MFs/PA/CP/16/47 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2016.05.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඒ අනුව රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ පරිපාලන, කළමනාකරණ සහ වෘත්තීයමය තනතුරුවල නිරත වන නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීම සඳහා සහ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීම සඳහා අදාල වන විධිවිධාන මෙයින් පනවනු ලැබේ. මෙම බලපත්‍රය සහ එයට අදාල පහසුකම් කිසිදු ආකාරයකින් අයිතිවාසිකමක් ලෙස නොසැලකිය යුතු අතර රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට මෙම චක්‍රලේඛය යටත්වේ.

### 01. හිමිකම් ලබන අවස්ථා

පහත සඳහන් කුමන තනතුරක හෝ තනතුරු කිහිපයක හෝ නියමිත සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා එම තනතුරු වල ස්ථිර සේවා කාලයක් ඇති නිලධාරීන් හට මෙම බලපත්‍රය හිමි වේ.

1.1 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය නිලධාරීන්.

1.2 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.3 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය ආයතනයන්හි (රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන හැර) "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.4 වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ත්‍රිවිධ හමුදාවන්හි ලුතිනන් කර්නල්, වින්ග් කමාන්ඩර්, කමාන්ඩර් සහ ඊට ඉහල නිලධාරීන්.

1.5 වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ත්‍රිවිධ හමුදාවන්හි වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, වාස්තු විද්‍යාඥයින් හා නීතිඥ වරුන් ලෙස සේවය කරනු ලබන නිලධාරීන් (හමුදා නිලය නොසලකා).

1.6 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට පත් කරනු ලැබූ "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති වසර දොලහක (12) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.7 රජයේ විශ්වවිද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජොෂ්ඨ මට්ටම" ට අයත් තනතුරක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර අටක (08) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.8 වසර දොලහක (12) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක නිලධාරීන්.

1.9 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇතුලත් සුදුසුකම් ලබන තනතුරක;

i වසර දොලහක (12) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක නිලධාරීන් සහ

ii. වසර නවයක (09) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජොෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක සේවය කරනු ලබන වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන් හා වරලත් වාස්තු විද්‍යාඥයින්.

1.10 විශ්වවිද්‍යාල කුලපති වරුන්.

1.11 "ලියාපදිංචි වෛද්‍ය නිලධාරී" තනතුරක පළමුවන ශ්‍රේණියේ වසර හයක (06) ක සක්‍රිය සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති "ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්".

1.12 වසර නවයක (09) සක්‍රිය සේවා කාලයක් හිමි රජයේ සංවර්ධන ව්‍යාපෘතියක හෝ ව්‍යාපෘති කිහිපයක (කොන්ත්‍රාත් පදනමින් හෝ) සේවය කරන ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින් හා නීතිඥවරුන්.

1.13 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව පිහිටුවා ඇති කොමිෂන් සභාවක වසර තුනක (3) සක්‍රිය සේවා කාලයක් සහිත කොමිෂන් සභා සභාපතිවරුන් හා සාමාජිකයින්.

## 02. හිමිකම් නොලබන අවස්ථා

මෙම චක්‍රලේඛය මගින් පහත සඳහන් නිලධාරි කාණ්ඩයන් ආවරණය නොවේ.

2.1 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විටත් කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ දෙවරකදී හෝ ඊට වැඩි වාර ගණනකදී හෝ වාහන ලබා ගෙන ඇති නිලධාරීන්.

2.2 වැටුප් රහිත නිවාඩු මත (මෙහි 3.4 වගන්තියට යටත්ව) නිදහස් කර ඇති නිලධාරීන්.

2.3 සුදුසුකම් ලබන තනතුරකට පෞද්ගලික වන සේ හෝ අයි සේවක පදනම මත හෝ පත්කර ඇති නිලධාරීන්.

2.4 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ගත් හෝ ඉවත් වූ පසුව සුදුසුකම් ලබන තනතුරකට කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති නිලධාරීන් (ඉහත 1.12 වගන්තිය යටතට ගැනෙන නිලධාරීන් හැර).

2.5 ආයතන සංග්‍රහයේ විධිවිධානයන් අනුව හෝ ඒ ඒ ආයතනයන්හි භාවිතයට ගනු ලබන පාලන විධිවිධාන හෝ නීති රීති අනුව මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර දැනට එම ක්‍රියාමාර්ගය අවසන් කර නොමැති නිලධාරීන්.

2.6 මෙයට පෙර කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එය ලියාපදිංචි කල දින සිට වසර දහය (10) ක් ඉක්මවා නොමැති නිලධාරීන්.

2.7 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් බැහැරව ආයතනය විසින් ඇති කරන ලද තනතුරක සේවය කරනු ලබන නිලධාරීන්.

## 03. කොන්දේසි, නියමයන් සහ සහන

3.1 මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සඳහා හිමිකම් ලබනුයේ තම සේවා කාලය තුල උපරිම වශයෙන් දෙවරක් පමණකි.

3.2 සහනදායී යෝජනා ක්‍රමයක් යටතේ මීට පෙර ලබා ගත් බලපත්‍රයක් භාවිත කර නොමැති අවස්ථාවලදී ඒ බවට බලපත්‍ර ලාභියා විසින් සනාථ කල යුතුය. එසේ සනාථ කිරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එම බලපත්‍රය භාවිත කලා සේ සලකනු ලැබේ.

3.3 මෙම චක්‍රලේඛය අනුව ඉහත "1.1" සිට "1.9" දක්වා වන කාණ්ඩයන් යටතේ සුදුසුකම් ලබන තනතුරු කිහිපයක සේවා කාලයන් එකතු කර අදාල බලපත්‍රය සඳහා සේවා කාලය ගණනය කල හැකි අතර එවැනි ඉල්ලීම් අදාල ලේකම්වරයාගේ ද නිර්දේශය සමඟ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු අතර අවශ්‍යතාවය අනුව තීරණයක් ලබා දීම හෝ අවශ්‍ය නම් මෙහි 5.1 වගන්තියේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම හෝ කරනු ඇත.

3.4 මෙම චක්‍රලේඛයෙහි සක්‍රීය සේවා කාලය යන්නෙන් අදහස් කරනුයේ සුදුසුකම් ලබන තනතුරක් සඳහා නිලධාරියාගේ සේවා කාලය ගණනයේදී වැඩ තහනමකට ලක් වීම මත, අඩ වැටුපකට හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම මත හෝ වෙනත් කුමන හෝ හේතුවක් මත පත්වීම් පෙරදාතම් කිරීම මත වූ කාලයන් අතහැර ගණනය කරනු ලබන සේවා කාලය වේ.

එසේ වුවද රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වැටුප් රහිතව තාවකාලිකව මුදා හැර ඇති රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිලධාරීන්ගේ එකී වැටුප් රහිත සේවා කාලය ද සක්‍රීය

සේවා කාලය යන්නට අයත් වේ. පශ්චාත් අධ්‍යයන කටයුතු සඳහා වන වැටුප් රහිත නිවාඩු, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සප්ත වාර්ෂික නිවාඩු, අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු ඇතුළුව ප්‍රසූත නිවාඩු සක්‍රිය සේවා කාලය ලෙස මෙම චක්‍රලේඛයේ අවශ්‍යතා සඳහා ගණනය කල යුතුය.

3.5 පෙරදාතම් කරන ලද කාලය සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා දීම සඳහා සක්‍රිය සේවා කාලය ලෙස ගණනය කරනු නොලැබුවද යම් නිලධාරියෙකුගේ පෙරදාතම් කාලය තුල ඔහු හෝ ඇය හට සුදුසුකම් ලබන තනතුරක වැඩ බැලීම සඳහා විධිමත් පරිදි පත්වීම් ලබා දී ඒ අනුව සේවය කර ඇත්නම් පමණක් (පත්වීම් බලධාරියා විසින් නිකුත් කරනු ලබන විධිමත් පත්වීම් ලිපියක් මගින්) එවිට එකී කාලය යථෝක්ත වරප්‍රසාදය සඳහා ගණනය කල හැකිය.

3.6 අධි සේවක පදනම මත හෝ තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හෝ තනතුරු ලබා දී ඇති නිලධාරීන්ගේ තනතුරු වලින් අධි සේවක පදනම හෝ පෞද්ගලික වන සේ යන්න ඉවත් කරනු ලැබූ අවස්ථාවකදී අදාල පදනම ඉවත් කිරීමට තීරණය ගනු ලැබූ දිනය නොව, එකී තීරණය ක්‍රියාත්මක වන දිනය (සාමාන්‍ය සේවක පදනමට පත් වන දිනය) පදනම් කර ගෙන බලපත්‍රය සඳහා වන සේවා කාලය ගණනය කල යුතුය. කෙසේ වුවද මෙම කාලය අදාල කරගත යුත්තේ බලපත්‍රය සඳහා සුදුසුකම් ලබන තනතුරක සේවා කාලය ගණනය කිරීමට පමණි. අදාල කාලය තුල බලපත්‍ර ලාභියා බලපත්‍ර කිහිපයකට සුදුසුකම් ලැබියහැකි වුවද නිකුත් කල යුත්තේ අධි සේවක පදනම ඉවත් කිරීමේ තීරණය ගනු ලබන දිනය වන විට වලංගුව පවතින චක්‍රලේඛය යටතේ එක් බලපත්‍රයක් පමණි.

3.7 ඉහත 3.6 පරිදි "පෞද්ගලික වන සේ" හෝ "අධි සේවක පදනම මත" යන්න ඉවත් කරන විට අදාල බලපත්‍ර ලාභියා විශ්‍රාම ලබා තිබුණද ඔහු විශ්‍රාම ලබන දිනය වන විට මෙම චක්‍රලේඛය පරිදි සුදුසුකම් ලබා ඇත්නම් සහ මෙම චක්‍රලේඛය ක්‍රියාත්මකව පවතිනම් පමණක් එම සහනය ලබා ගත හැක. එවැනි අවස්ථාවකදී ඔහු අවසන් වරට සේවය කරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම බලපත්‍රය නිකුත් කල යුතුය.

3.8 මෙම චක්‍රලේඛය යටතේ

i. සුදුසුකම් ලබන අයෙකු මිය ගියහොත් හිමිවිය යුතු බලපත්‍රය කලත්‍රයා හෝ කලත්‍රයෙකු නොමැති අවස්ථාවකදී නීත්‍යානුකූල උරුමකරු හෝ උරුමකරුවන් විසින් කරනු ලබන ඉල්ලීමක් සහ අයදුම් පත්‍රයක් මත ලබා ගත හැකිය. කෙසේ වුවද උරුමකරුවන් කිහිපදෙනෙකු සිටින විට මේ සඳහා ඉඩකඩ ලැබෙනුයේ සියළු නීත්‍යානුකූල උරුමකරුවන්ගේ කැමැත්ත හිමි වන නීත්‍යානුකූල උරුමකරුට පමණි.

ii. බලපත්‍රයක් ලබාගෙන ඒ යටතේ වාහනයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබියදී හෝ එලෙස ලබා ගෙන වසර 05 ක් ගත වීමට මත්තෙන් හෝ බලපත්‍රලාභියා මිය ගියහොත් එම බලපත්‍රයේ හෝ මෝටර් රථයේ හෝ නීත්‍යානුකූල හිමිකම කලත්‍රයාට ලබා ගත හැක. කලත්‍රයෙකු නොමැති අවස්ථාවකදී නීත්‍යානුකූල උරුමකරුට මෙම සහනය ලබාගත හැකිය. නීත්‍යානුකූල උරුමකරුවන් කිහිපදෙනෙකු සිටින විට සියළු නීත්‍යානුකූල උරුමකරුවන්ගේ කැමැත්ත හිමි වන නීත්‍යානුකූල උරුමකරුට පමණක් මෙම සහනය හිමි වේ.

3.9 යම් නිලධාරියෙකුට විරුද්ධ විනය ක්‍රියාමාර්ගයක තීරණය ප්‍රකාශයට පත් වීමට පෙර එකී නිලධාරියා විශ්‍රාම ලැබුවද එම තීරණය ප්‍රකාර සියළු චෝදනාවන්ගෙන් නිදහස් වන අවස්ථාවකදී හිමි වන සහනය පවතින චක්‍රලේඛ විධිවිධාන යටතේ ලබා ගත හැක.

3.10 මෙම යෝජනා ක්‍රමය යටතේ

i. සාමාන්‍යයෙන් මෙරටට ආනයනය කල හැකි වයස් සීමාව ඇතුලත වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ (H.S. Headings) 87.03 හෝ 87.04 ට අයත් වන මෝටර් රථ හෝ ඩබල් කැබ් රථ (Double Cab) හෝ යන වාහන වර්ගයකින් ඕනෑම වාහනයක් ලබා ගැනීමට හැකියාව පවතී.

ii. ලබා ගත හැකි වාහනයක උපරිම මී.ර.ගැ. වටිනාකම ඇ.එ.ජ.ඩොලර් 30,000 කි. අනෙකුත් ඕනෑම මුදල් ඒකකයකින් ණයවර ලිපි විවෘත කරන්නේ නම් එහි වටිනාකම අදාල ණයවර ලිපිය විවෘත කරන දිනට පැවති විනිමය අනුපාතය අනුව ඇ.එ.ජ.ඩොලර් 30,000 සීමාව නොඉක්ම විය යුතුය. ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී, මෙකී සීමාව ඉක්මවා ඇති වාහන සඳහා කිසිදු බදු සහනයක් හිමි නොවන අතර ඒවා සාමාන්‍ය ආනයන (බදු සහන රහිත) සේ සලකා සම්පූර්ණ බදු හා ගාස්තු ශ්‍රී ලංකා රේගුව විසින් අය කෙරේ. ණයවර ලිපි විවෘත කිරීමේදී බලපත්‍ර ලාභියා මෙම අවදානම පිළිබඳව සැලකිය යුතුය.

iii. බලපත්‍රය උපයෝගී කර ගෙන ලබා ගන්නා මෝටර් රථයක් සඳහා බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු මුළු නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු මුදලින් 50% ක බදු සහනයක් හිමිවේ. වාහනය රේගුවෙන් නිදහස් කරනු ලබන අවස්ථාවේදී බදු සහනය ගණනය කරනු ලබන්නේ අදාල රේගු සටහන්කරය (CUS DEC) ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ පවත්නා බදු අනුපාතයන් සහ වාහනයේ වටිනාකම අනුවය.

iv. ලබා ගන්නා ලද මෝටර් රථ හදිසි අනතුරකට ලක් වීම මත නැවත ප්‍රයෝජනයට ගත නොහැකි වන පරිදි හානියට පත් වූ අවස්ථාවකදී එහි සුන්බුන් අයිතිය අදාල රක්ෂණ සමාගම වෙත පැවරීමට හා හානිය පූර්ණය කර ගැනීමට බලපත්‍ර ලාභියාට හැකියාව ඇත. එවැනි අවස්ථාවකදී වාහනයේ ලියාපදිංචි සහතිකය අවලංගු කල යුතු අතර ඒ වෙනුවට බලපත්‍රලාභියා වෙත නව බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ.

v. ලබා ගනු ලබන මෝටර් රථය එම බලපත්‍රය හිමි නිලධාරියා නමින් ලියාපදිංචි කල යුතු අතර කිසිදු හේතුවක් මත (3.8 (i, ii) සහ 3.10 (iv) වගන්තීන්හි දැක්වෙන අවශ්‍යතාවයන් හැර) ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට වසර පහක් (05) ගතවන තුරු ලියාපදිංචිය මාරු කල නොහැක. කෙසේවුවද 2015.11.20 දින දක්වා ක්‍රියාත්මකව තිබූ 1/2013 චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ලබා ගත් වාහන පැවරීම සම්බන්ධයෙන් 2014.03.25 දිනැති 01/(02)/2013 චක්‍රලේඛයේ කොන්දේසි ඉදිරියටත් අදාල කර ගත යුතුය.

vi. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නිලධාරියා සුදුසුකම් ලබන බව තහවුරු කිරීම පිණිස ඔහු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය යයි තහවුරු වුවහොත් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී වාහනයක් ලබා ගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් අදාල වන නීති යටතේ කටයුතු කරනු ඇත. එසේම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නීතිමය අයුරින් සහ විනයානුකූලවද කටයුතු කරනු ඇත.

vii. නිකුත් කරනු ලබන බලපත්‍රය ඒ යටතේ වාහනයක් ලබා ගන්නා තුරු වලංගු වේ. කෙසේ වුවද කලින් කලට රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම මගින් වාහනයක් ලබා නොගෙන බලපත්‍රය ලඟ තබා ගෙන සිටීම මත සිදු වන හානි හෝ අලාභයන් පිළිබඳව වග කියනු නොලැබේ.

viii. ලබා ගත් බලපත්‍රය හෝ එහි බැංකු පිටපත හෝ අස්ථාන ගත වුවහොත් බලපත්‍ර ලාභියා විසින් වහාම පොලීසියට පැමිණිලි කල යුතුය. අනතුරුව එම පැමිණිල්ලේ පිටපතක් සහිතව එම බලපත්‍රය අවලංගු කරන ලෙස ඉල්ලීමක් බලපත්‍රය නිකුත් කරන ලද ලේකම්වරයා වෙත ලබා දිය යුතුය. එවැනි ඉල්ලීමක් ලද වහාම අදාල බලධාරියා විසින් අස්ථානගත වූ බලපත්‍රය අවලංගු කර ඒ පිළිබඳව රේගු අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දැනුවත් කල යුතුය. ඒ වන විට අදාල බලපත්‍රය භාවිත කර නොමැති බවට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් ලිඛිත තහවුරු කිරීමක් ලබා ගෙන මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන්නේ නම් පමණක් නැවත නියමිත ආකාරයට අයදුම් පත්‍රයක් ලබා ගැනීම මගින් එම නිලධාරියාට බලපත්‍රයක් නිකුත් කිරීමට බාධාවක් නොමැත.

ix. මෝටර් රථයක් ආනයනය කිරීම සඳහා හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන වාහනයක් මිලදී ගැනීම සඳහා බලපත්‍ර ලාභියාගේ නමින්ම විධිමත් අයුරින් ණයවර ලිපියක් විවෘත කිරීම හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන ආයතනයකට විධිමත්ව ගෙවීම් සිදු කර ඒ වෙනුවට ලදුපතක් හෝ ලබා ගැනීම සිදුකල යුතුය.

3.11 ආයතන සංග්‍රහයේ II වන වෙළුමේ 48 වන පරිච්ඡේදයේ I වන උපලේඛණයේ ඇතුලත් වන වැරදි යටතේ එම වෙළුමේ 24:3 වගන්තියේ සඳහන් වන ප්‍රධාන දඬුවම් හෝ වෙනත් විධිවිධානයක් යටතේ ඊට සමාන දඬුවම් ලබා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පහත වගන්තිය (3.12) ප්‍රකාරව කටයුතු කල යුතුය.

3.12 ඉහත 3.5, 3.6, 3.7, 3.8, 3.9, 3.10 (iv) සහ 3.11 සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සඳහා අදාල ලේකම්වරයාගේ නිර්දේශය වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමුකල යුතුය, එවැනි ඉල්ලීම් ලද විට තවදුරටත් පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම හෝ අවශ්‍ය අවස්ථාවලදී මෙහි 5.1 වගන්තිය පරිදි කටයුතු කිරීම හෝ කරනු ලැබේ.

## 04. ක්‍රියාපටිපාටිය

4.1 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් මෙම චක්‍රලේඛයේ "ඇමුණුම III" යටතේ අයදුම්පත්‍රය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කල යුතු වේ (පරිගණක ගත කිරීමේ පහසුව සඳහා ඉල්ලුම්පත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුය). අයදුම් කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයන්හි ප්‍රකාශිත තොරතුරු නීත්‍යානුකූල ප්‍රකාශ ලෙස සලකනු ලැබේ. එබැවින් අපැහැදිලි අයුරින් තොරතුරු සැපයීම, අයදුම් පත්‍රයේ සම්පූර්ණ කලයුතු කොටස් මගහැරීම සහ සාවද්‍ය තොරතුරු සැපයීම මත බලපත්‍රය ප්‍රමාද වීම හෝ අහිමි වීම පිළිබඳ සම්පූර්ණ වගකීම බලපත්‍ර අයදුම්කරු විසින් දැරිය යුතුය.

4.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලියකියවිලිද සමග අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කල යුතුය.

i. පළමු වරට බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පත්වීම් ලිපියේ හා සේවය ස්ථිර කිරීමේ ලිපිය.

ii. දෙවන වරට බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පළමු වරට බදු සහන යටතේ ලබා ගත් මෝටර් රථය ලියාපදිංචි කල සහතිකය.

iii. අස්ථානගතවූ බලපත්‍රයක් වෙනුවට නව බලපත්‍රයක් අයදුම් කිරීමේදී ඉහත ලිපි ලේඛණයන්ට අමතරව අස්ථාන ගතවූ බවට පොලිස් ස්ථානයක් වෙත කරන ලද පැමිණිල්ලේ පිටපත හා ඒ අනුව අදාල බලපත්‍රය අහෝසි කිරීමේ ලිපියේ පිටපත.

iv. මෙම ලේඛණයන්ට අමතරව අදාල ඉල්ලුම්කරුගේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා සුදුසු බවට අදාල බලපත්‍රය නිකුත් කරනු ලබන බලධාරියා සුදුසු යැයි සිතන ඕනෑම ලියවිල්ලක්.

v. ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් වූ විට මෙම සහන යටතේ කලින් ගෙන්වන ලද වාහන පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීම සුදුසු බවට බලපත්‍රය නිකුත් කරනු ලබන නිලධාරියාට හැඟී ගියහොත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විමසා සහතික කරගත යුතුවේ.

4.3 බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ බලපත්‍ර ලාභියා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන බැවින්, එම තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව හා ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසු පමණක් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් විසින් අයදුම්පත්‍රය නිර්දේශ කළ යුතු අතර බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම බලපත්‍ර නිකුත් කරනු ලබන නිලධාරියාද ඒ පිළිබඳව සෑහීමකට පත්විය යුතුය.

4.4 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ "ඇමුණුම II" මගින් දක්වා ඇති ආයතනවල ලේකම්වරුන් හට මෙයින් බලය ලබා දෙනු ලැබේ. එලෙස නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම පිටපත් පහත සඳහන් අයුරින් අදාල ගොනුවලට සහ ආයතන වෙත බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදීම යොමු කල යුතුය.

| | | |
|---|---|---|
| i. | නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව | |
| ii. | අධ්‍යක්ෂ ජනරාල් | - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| iii. | අධ්‍යක්ෂ ජනරාල් | - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව |
| iv. | කොමසාරිස් ජනරාල් | - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| v. | විගණකාධිපති | - විගණකාධිපති දෙපාර්තමේන්තුව |

4.5 මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත මෝටර් රථය ලබා ගත් වහාම ඊට අදාල රේගු සටහන්කරයේ (CUSDEC) හෝ දේශීය වශයෙන් මිලදී ගත් විට ලැබෙන ඉන්වොයිසියේ හෝ පිටපතක් බලපත්‍ර ලාභියා විසින් සිය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම පිණිස සිය සේවා ස්ථානය වෙත ලබා දිය යුතු අතර එය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර ඇති බවට ආයතන ප්‍රධානියා සෑහීමකට පත්විය යුතුය.

## 05. අනෙකුත් කරුණු

5.1 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර ලබාගැනීමට සුදුසුකම් ලබන තනතුරු හා විධිවිධාන පිළිබඳ අර්ථ නිරූපණ හා අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් ගැටළු ඇති වුවහොත් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතු වේ. එවිට අදාල කරුණු පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම හෝ තව දුරටත් අවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව වෙත අදාල කරුණ ඉදිරිපත් කර අවසන් තීරණයක් ලබා දීම කරනු ඇත.

5.2 මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කිරීම සෑම ලේකම්වරයෙකුගේම වගකීම වේ.

5.3 මෙසේ ලබා ගන්නා බලපත්‍ර යටතේ පිළිවෙලින් ආනයනය කරනු ලබන හෝ දේශීයව මිලදී ගනු ලබන හෝ වාහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හෝ දේශීයව අදාල වාහන සපයනු ලබන ආයතන විසින් හෝ පහත සඳහන් තොරතුරු මාසිකව ඊළඟ මාසයේ මුල් සති දෙක තුල වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුවේ.

i. බලපත්‍ර අංකය
ii. බලපත්‍ර හිමියාගේ නම, තනතුර, ආයතනය හා අමාත්‍යාංශය
iii. මෝටර් රථයේ වටිනාකම
iv. බදු වටිනාකම පිළිබඳ විස්තර (මුළු, කපා හරින ලද හා ගෙවන ලද)

5.4 මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් බලපත්‍රය මත ආනයනය කළ හෝ දේශීයව ලබා ගත් වාහනය මුල් ලියාපදිංචි දින සිට වසර පහක් (05) ඉක්ම ගිය පසු බදු ගෙවීමෙන් තොරව අන් අයෙකුට පැවරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වරයාට හැකිය.

5.5 මේ යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රවලට අදාලව පැහැදිලි තොරතුරු ක්‍රමවේදයක් පවත්වා ගැනීම සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රය සහ නිකුත් කල යුතු බලපත්‍රය අංක කල යුතු ආකාරය "ඇමුණුම I" හි දක්වා ඇත.

5.6 රාජ්‍ය නිලධාරීන්හට තමන් දරන තනතුරු අනුව බදු සහන යටතේ වාහන ලබා ගැනීමට අවස්ථාව සලසා දීම ඔවුන්ට පෞද්ගලික වන සේ ලබා දී ඇති සුවිශේෂි වරප්‍රසාදයකි. නිලධාරියාගේ අවශ්‍යතාව අනුව බලපත්‍ර යටතේ ලබා ගත් මෝටර් රථයක් මෙම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් අන් අයෙකුට පැවරීම දඬුවම් ලැබිය හැකි වරදකි. ඒ අයුරින් අදාල කොන්දේසි උල්ලංඝනය නොකිරීමට බලපත්‍ර ලාභියා වග බලා ගතයුතු අතර එසේ උල්ලංඝනය වන අවස්ථාවන්හිදී පවත්නා නීති යටතේ ඔවුන්ට විරුද්ධව කටයුතු කෙරෙනු ඇත. තවද, සහනදායි බලපත්‍ර භාවිත කරමින් කිසියම් අක්‍රමිකතාවක් සිදු වුවහොත් එමගින් රජයේ ආදායමට ඇතිවන අහිතකර බලපෑම වලක්වාලමින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මෙම හිමිකම ලබන සියළුම රාජ්‍ය නිලධාරීන් සතු වගකීමකි.

5.7 මෙම කොන්දේසි සහ සහනයන් 2015.11.21 දින සිට ක්‍රියාත්මක කෙරේ.

ආර්.එච්.එස්. සමරතුංග
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | විගණකාධිපති | - අ.කා.ස |
| 02. | මහ බැංකුවේ අධිපති | - අ.කා.ස |
| 03. | අධක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. | අධක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | - අ.කා.ස |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු | - අ.කා.ස |
| 06. | අධක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | - අ.කා.ස |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | - අ.කා.ස |
| 08. | කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | - අ.කා.ස |
| 09. | කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | - අ.කා.ස. |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | - අ.කා.ස. |

"ඇමුණුම III"

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ සහනදායී මෝටර් රථ ආනයන

බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අයදුම් පත්‍රය

'අ' කොටස

*බලපත්‍රය නිකුත් කරනු ලබන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණයි (ඇමුණුම් I අනුව)*

අයදුම්පත්‍ර අංකය

---

( මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර අදාල චක්‍රලේඛය හොඳින් කියවන්න)

'ආ' කොටස - නිලධාරියා පිළිබඳ පෞද්ගලික විස්තර

01. නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්) අකුරු හා වචන වෙන් කිරීම සඳහා ඒ අතර කොටුවක් හිස්ව තබන්න

1.1 මුලකුරු සමග නම :

1.2 සම්පූර්ණ නම :

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. පෞද්ගලික ලිපිනය :

04. පෞද්ගලික දුරකථන අංක :

| ස්ථාවර | ජංගම |
|---|---|
| | |

05. මීට පෙර ලබා ගත් සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර පිළිබඳ විස්තර :

| | දිනය | මාසය | වර්ෂය | ලියාපදිංචි කල දිනය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |

06. තනතුරු හා සේවා ස්ථාන :

6.1 වර්තමාන තනතුර (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්)

6.2 වර්තමාන තනතුරට පත් වූ දිනය:.....................මාසය:............................වර්ෂය:................

6.3 වර්තමාන තනතුරේ ශ්‍රේණිය : ------------------------------- හා පන්තිය : -----------------------

6.4 වර්තමාන තනතුරට අයත් වැටුප් කේතය :------------------------------------------

6.5 වර්තමාන සේවා ස්ථානය:

6.6 සේවා ස්ථානයේ ලිපිනය:

6.7 දුරකථන අංකය හා ෆැක්ස් අංකය:

| දුරකථන | ෆැක්ස් |
|---|---|
| | |

6.8 වර්තමාන සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය / පළාත් සභාව: (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්)

6.9 මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන තනතුරකට පත් වූ දිනය: .........මාසය:........වර්ෂය:..........

6.10 එම තනතුරේ ස්ථිර කර තිබේද ? : ------------------

6.11 එම තනතුරේ ස්ථිර කර ඇත්නම් ස්ථිර කල දිනය: ........... මාසය:.......වර්ෂය:..........

6.12 සේවා කාලයන් පිළිබඳ විස්තර : (වර්තමාන තනතුරෙන් ආරම්භ කරන්න)

| තනතුර හා සේවා ස්ථානය | සිට | | | දක්වා | | | සම්පූර්ණ කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

6.13 වැටුප් රහිත සේවා කාලයන් පිළිබඳ විස්තර :

| තනතුර හා සේවා ස්ථානය | සිට | | | දක්වා | | | සම්පූර්ණ කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

---

## 'ඈ' කොටස - කලත්‍රයා සහ පසු අයිතිකරු පිළිබඳ විස්තර

07. කලත්‍රයා/පසු අයිතිකරු පිළිබඳ විස්තර

7.1 කලත්‍රයාගේ සම්පූර්ණ නම :

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

7.2 කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

7.3 අවිවාහක නම් පසු අයිතිකරුගේ සම්පූර්ණ නම :

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

7.4 පසු අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

---

## 'ඉ' කොටස - අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම පරිදි නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු හා ලිපි ලේඛණ අසත්‍ය බවට හෝ ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බවට හෙලි වුවහොත් මාගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වන බවද, අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත පවතින නීති රීති යටතේ දඬුවම් ලැබීමට සිදුවන බව ද මා දනිමි. තවද මෝටර් රථය ලබා ගැනීමට පෙර හෝ පසුව මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව හෙලි වුවහොත් අදාල සහනයන් අහිමි වීමට සහ ලැබූ සහනයන් නැවත රජයට ගෙවීමට හා පවතින නීති යටතේ පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ද එකඟ වෙමි.

.......................................... දිනය

.......................................... අයදුම්කරුගේ අත්සන

"ඊ" කොටස-ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

මගේ අංකය (1).......................................................

ලේකම්
(2) .................................................................

(3).........................................................................හි (4) ..............................................................................
තනතුරෙහි සේවය කරනු ලබන (5)............................................................................ ගරු ස්වාමීන් වහන්සේ/මහතා/මෙනවිය/මහත්මිය විසින් මෙම (6).................................................................... වෙත (7)..................................... දිනැතිව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ අයදුම් කර ඇති අයදුම්පත්‍රය හා ඒ සමඟ යොමු කර ඇති අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂා කලෙමි.

ඒ අනුව මෙම නිලධාරියා අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර හා අවශ්‍ය ලිපි ලේඛණ සියල්ල සපයා ඇති බවට සහතික කරමි. එමෙන්ම මෙම නිලධාරියා උක්ත චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන තනතුරක ස්ථිර කර ඇති බව සහතික කරමි. සපයා ඇති තොරතුරු අනුව මෙම නිලධාරියා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි (8) ...................................................... කාණ්ඩය/කාණ්ඩ යටතේ සුදුසුකම් ලබා ඇත. එබැවින් ඉහත (5)..................................................................... ගරු ස්වාමීන්වහන්සේ/මහතා/මෙනවිය/මහත්මිය හට එකී චක්‍රලේඛය යටතේ සහනදායී මෝටර්රථ බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

.....................................
දිනය

..............................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඉහත සඳහන් මෙම කොටසේ අංකවලට අදාල විස්තර පහත පරිදි වේ.

(1) නිලධාරියා සේවය කරනු ලබන ආයතනයේ ලිපිගොනු අංකය, (2)අයදුම්කරු අයත් ආයතනය/ කොමිෂන් සභාව/ පළාත් සභාව, (3)අයදුම්කරුගේ වර්තමාන සේවා ස්ථානය, (4)අයදුම්කරුගේ වර්තමාන තනතුර, (5)අයදුම්කරුගේ නම, (6)සහතික කරනු ලබන ආයතන ප්‍රධානියාගේ ආයතනය, (7) අයදුම්පතෙහි දිනය, (8) චක්‍රලේඛයේ 01 වගන්තිය යටතේ සුදුසුකම් ලබන කාණ්ඩය හෝ කාණ්ඩ

"උ" කොටස-අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

අයදුම්පත්‍ර අනු අංකය.............................
මගේ අංකය..............................................

ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ඉහත සපයා ඇති දත්ත සහ තොරතුරු සම්පූර්ණයෙන්ම නිවැරදිබවත් ඒ පිළිබඳ මා පෞද්ගලිකව සෑහීමට පත්වී ඇති බවත් මින් සහතික කරමි.ඒ අනුව අයදුම්කරුවන ......................................................................................... ගරු ස්වාමීන් වහන්සේ/මහතා/මෙනවිය/මහත්මිය වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ සහනදායී මෝටර්රථ ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට සියලු සුදුසුකම් සපුරා ඇති බවත් මින් සහතික කරන අතර බලපත්‍රයක් ලබා දීම නිර්දේශ කරමි.

.........................................
දිනය

.....................................................
අමාත්‍යාංශ ලේකම් අත්සන හා නිල මුද්‍රාව

"ඌ" කොටස

මගේ අංකය..................................

ඉහත ඉල්ලුම්පත්‍රය අනුමත කරමි/නොකරමි.

..........................................
දිනය

.............................................
ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව